# සුරලොවින් අපේ පවුලට ආ නදීප මල්ලි

නත්තල් දවසේ හිමිදිරි උදයේ
ගවලෙන ළඟ දණගසිමින් යැදුවේ
පතමින් බිළිඳු සොහොයුරෙක් සමිඳේ
ඔබ දුන් දේව තිළිණයයි ලැබුණේ

මුහුණේ නිතරම රැන්දූ සිනාවෙන්
එළිය කළා පහනක් ලෙස නිවහන
දිවියේ පැසසුම් ලබනා විට ඔබ
පතල කළා දෙවි ආදරෙ ලොව තුළ

දහතුන් වසරක් ඔබ ආ ගමනේ
දෙවිඳු භක්තියෙන් නිති දිවි ගෙවුණේ
පල්ලිය පාසල මිතුරන් අතරේ
කැපී පෙනුණු නන්දීපය ඔබ වේ

අභිසෙස් ගන්නට දෙවි මිදි උයනේ
පැතුම් පැතු ඔබ නිති මුළු දිවියේ
සමිඳු තුරුල්ලට කැඳවා ඇත්තේ
නිතින යදින්නයි අප සැම වෙනුවෙන්

තනු ගී නැංවූ ඔබෙ හඬ ස්වරයේ
රාවය සැමතැන තවමත් රැව්දේ
සුවඳ හමන ඔබෙ පිවිතුරු දිවියේ
සුවදින් ජීවිත යළි පණ ලැබුවේ

මල්ලියෙ නැවතත් හමුවණ තුරු අප
දිව්‍ය නිකායේ තුටින් වෙසෙනු මැන
දේව දූතයන් සමඟින් සැමදින
සුර ගීයෙන් දෙවිඳුන් පසසනු මැන

ආදර අක්කා
-නවෝදි ධර්මසිරි-